# රත්නපුර ප්‍රාදේශිය සභාව 2022.06.22 වන දින මහා සභා රැස්වීම වාර්තාව

රත්නපුර ප්‍රාදේශිය සභාවේ මහා සභා රැස්වීම 2022.06.22 වන දින පෙ.ව.10.30 ට ගරු උප සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රත්නපුර ප්‍රාදේශිය සභාවේ සභා රැස්වීම් ශාලාවේදී පැවැත්විණි.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| **01.** | ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක මහතා | ගරු සභාපති |
| **02.** | ජී.ජී.ජානක පුෂ්ප කුමාර මහතා | ගරු උප සභාපති |
| **03.** | ටී.ප්‍රේමතිලක මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **04.** | එන්.විජය ශ්‍රී ශාන්ත මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **05.** | ජී.එච්.රංජිත් ධර්මකීර්ති මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **06.** | අයි.වී.අඛිල රෝෂන් ලක්මාල් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **07.** | කේ.රණවක කළුආරච්චි මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **08.** | ඊ.කේ.ජී.ප්‍රියන්ත පෙරේරා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **09.** | ඒ.දොන්.නිශාන් දමිත් අල්ගම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **10** | යූ.කේ.නන්දාවතී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **11.** | එම්.ඒ.ඩික්සන් ජයතිලක මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **12.** | ආර්.බී.නාලක සුදත් ශ්‍රී හේමපාල මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **13.** | ඒ.එම්.නිලන්ති මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **14.** | කේ.ඒ.ජයරත්න මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **15.** | පී.වී.ඉන්දික ලක්ෂ්මන් විතාරම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **16.** | ඒ.එම්.සමන් පාලිත විජේරත්න මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **17.** | කේ.වී.කමනි සේනාධීර මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **18.** | ගෝපාල් තම්බිරාජා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **19.** | බී.ඒ.ලලිත් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **20.** | ඩී.නිලන්ති දීපිකා යසරත්න මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **21.** | ටී.ජී.ඉන්ද්‍රාණි මැණිකේ මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **22.** | ජී.ජී.ලිලානි චන්ද්‍රතිලක මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **23.** | ජී.අනුර ප්‍රභාත් අමරවංශ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **24.** | රාමසාමි මෝහන සුන්දරම් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **25.** | එම්.වජිරා නන්දනී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **26.** | එල්.එම්.තමරා සුභාෂිණි මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| **27.** | කේ.ජී. නිහාල් අමරසිංහ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා/ තුමියන්ලා

| | | |
|---|---|---|
| 01. | පී.රොහාන් ශ්‍රියන්ත කුමාර මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 02. | පී.වී.ඉසුරු ජයලත් විතාරණ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 03. | කේ.නිරෝෂන් ලක්මාල් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 04. | ජී.වී.අනූෂ විරාජ් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 05. | ඕ.කේ.සුගත් ජයවික්‍රම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 06. | බී.ප්‍රියන්ත මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 07. | ආර්.ඒ.පත්මා නන්දනී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 08. | පී.උදය කුමාර් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 09. | මංජුල ශ්‍රීලාල් බී ගමගේ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

**සහභාගී වූ නිලධාරීන් :-**

01.ජී.යූ.එම්.සී.සිරිවර්ධන මහත්මිය - ලේකම්

02.ජී.එච්.අයි.ඩී.ආරියමිත්‍ර මහත්මිය - සංවර්ධන නිලධාරී

**01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.05.27 වන දින මහා සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, පසුගිය මුදල් කාරක සභා වාර්තාව ස්ථිර කිරීම සඳහා තමන් ගේ නම නොව ටී.ප්‍රේමතිලක මහතාගේ නම ඇතුලත් විය යුතු බවත්, ඒ අනුව සංශෝධනය කරමින් පසුගිය මහා වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී ටී.ප්‍රේමතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**SLILG /09/NL/2022-04 හා 2022.06.01 දිනැති ලිපියට අනුව පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මගින් 2022 ජූනි මස 23,24,25 දිනවල zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වීමට කටයුතු යොදා ඇති "නිශ්චල දේපළ කළමණාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව - නීති අංශය " පිළිබඳව දැනුවත් කරන ලදී.**

**03.ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන සභාව ඉදිරියේ තැබීම.**

i. **2022.06.22 දිනැතිව "මාර්ග පලුදු කිරීම සම්බන්ධවයි " මැයෙන් වූ ගරු උප සභාපතිතුමා විසින්ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.**

**04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න**

නැත

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා**

**නැත.**

**06.කාරක සභාවල වාර්තා**

2022.06.01 දිනැති මුදල් කාරක සභා වාර්තාව සම්මත කිරීම සුදුසු බව ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු මන්ත්‍රී ටී.ප්‍රේමතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

මාසික ආදායම් හා වියදම් සාරාංශ වාර්තාව මහා සභාවට ඉදදිරිපත් කරන ලදී.

**08.ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ කතා**

i. **ගරු මන්ත්‍රී අනුර ප්‍රභාත් අමරවංශ මහතා**

රටේ මේ වන විට ආර්ථිකය අර්බුදයට ලක්වෙලා තිබෙන මොහෝතේ පක්ෂයක් විදියට යෝජනාවක් කළා ජාතික වැඩපිළිවෙළක් විදියට ජන අරගලයෙන් මචිබිමට මාතෘකාව යටතේ සෑම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයක් තුලම මුල් අධියර විදියට ගොවිපොළවල් දෙකක් තෝරාගෙන සංවිධානාත්මකව සිදුකරන්න කටයුතු කරන්නත් , දැනට පළාබද්දල ප්‍රදේශයේ ගොවිපළක් පවත්වාගෙන යනවා. රත්තුරුගල අතුරලිය ප්‍රදේශයේද ගොවිපළක් ආරම්භ කරන බවත්, මන්ත්‍රී වැටුප දිළිදු පවුල් සඳහා පෝෂණ මලු බෙදා දීම සඳහා කටයුතු කරන බවත්,රෝහල් වල තිබෙන අත්‍යවශ්‍ය ඖෂධ හිඟය වෙනුවෙන් ලොකයේ රටවල් කිහිපයක් සමඟ සම්බන්ධවෙලා පක්ෂය විසින් රටපුරා රොහල් සඳහා ලබා දීමට වැඩ පිළිවෙළක් සකස් කරගෙන යන බවත් එතුමා පැවසුවේය.

රටේ තත්වය ඉතාමත්ම ඛේදවාචකයක් ,රටේ ජනතාව බලාපොරොත්තු වූ දෙයක් නෙවෙයි. මේ දක්වා රට පාලනය කළ පාලකයන් විසින් නිර්මාණය කරලා මේ දක්වා රටේ ජනතාව අමාරු තත්වයට ඇඳ දමා ඇති බවත්, ඉන්ධන පෝලිම්, ගෑස් පෝලිම් ,ආහාර හිඟය , ඉදිරියේදී තේ කර්මාන්තයට සිදුවන අර්බුදයක් ඇති වන බවත්, ගරු මන්ත්‍රීවරයා පැවසුවේය. අලුත් අග්‍රාමාත්‍යවරයෙක් පත්වෙලා නව විපර්යාසයක් වෙයි කියලා හිතුවත් රනිල් වික්‍රමසිංහ පැමිණියා කියලා රටට එක ඩොලරයක්වත් ආවේ නැති බවත්, පවුල් පාලනය ආරක්ෂා වීම පමණක් සිදුවූ බව එතුමා පැවසුවේය. ආර්ථික අර්බුදය කෙසේ වෙතත් ඔවුන්ගේ දේශපාලන අර්බුදය විසඳා ගැනීමේ උත්සහයක යෙදෙමින් ගැටළු කාරී තත්වයන් පිළිබඳව නොතකා කටයුතු කරමින් සිටින බව එතුමා පැවසුවේය. බස් සංගම්, ත්‍රීරෝද රථ සංගම් ඇතුළු වෘත්තීය සමිති ගණනාවක් එක්ව සංවිධානය වී මේ ආණ්ඩුව පලවා හැරීම සඳහා අවශ්‍ය කටයුතු හෙට දවසේ සිදුකරන බව එතුමා වැඩිදුරටත් සඳහන් කළේය.

## ii. ගරු මන්ත්‍රී ගෝපාල් තම්බිරාජා මහතා

හපුගස්තැන්න වසමේ ගිය මාසේ 21 වන දින නාය යෑමක් සිදුවී පවුල් නවයක් (හතලිස් දෙදෙනෙකු ) පහළ වේවැල් කැටිය ස්ථානයේ තවමත් රැඳී සිටින බවත්, හපුගස්තැන්න ප්‍රදේශයේ පිරිසකුත් දෙහෙන කන්ද වතුයාය පිරිසකුත් ක්‍රිස්ත්‍රියානි පල්ලිවල පිරිසක්, බෞද්ධාගමික ස්වාමීන් වහන්සේලා, කොළඹ කෝවිලේ පිරිසක් ,මුස්ලිම් පල්ලියේ පිරිසක් ද ඇතුළු සියළුම දෙනා එක්ව ආධාර උපකාර කළ බව එතුමා පැවසුවේය. ඒ වෙනුවෙන් හපුගස්තැන්න වසමේ මන්ත්‍රී වරයා ලෙස ඒ සියළු දෙනාට ස්තූතිය එල කරන බව පැවසුවේය. මේ පිළිබඳව ආණ්ඩුකාරතුමාටද දැනුම් දීමක් කළ බව.දිස්ත්‍රික් ලේකම් තුමියට හා ප්‍රාදේශිය ලේකම් තුමියටද මේ පිළිබඳව දැනුම් දුන් බවත්, අද රටේ තිබෙන තත්වය අනුව මුළ්‍යමය ආධාර ලබා දීමට හැකියාවක් නොමැති බව දන්වා සිටියත් රාජකාරීමය වශයෙන් සිදුකළ දේ පිළිබඳව ස්තූතිවන්ත වන බව එතුමා පැවසුවේය. පොඩි ළමයි තියාගෙන එම ස්ථානයේ ජීවත් වීමට අපහසු බව එතුමා පැවසුවේය. වතු අධිකාරි පොරොන්දු වුනා නේවාසිකයන් නොමැති වතු බංගලා තුළ තාවකාලිකව සිටීම සඳහා අවස්ථාව සළසා දෙන බවට පොරොන්දු වූ බව එතුමා පැවසුවේය. තවම එම්බී ආර්ඕ රිපෝට් තවම ඇවිත් නැහැ ඒවා ඇවිත් තිබුණානම් මේ අය හට වෙනත් ප්‍රදේශයක් වෙත යොමු කිරීමට හෝ හැකියාව ඇති බව එතුමා පැවසුවේය. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා හා අකිල මන්ත්‍රීතුමා ඒ ස්තානයට ඇවිත් බැලුවා ඇත්තටම කණගාටුයි අපේ සභාපතිතුමාට කීප සැරයක්ම කතා කරලා කිව්වත් ආවේ නෑ. ලේකම්තුමියට ලිපියක් දුන්නා සභාපතිතුමාට දෙන්න කියලා. සභාපතිතුමාට දොස් කියනවා නොවෙයි. අදත් හෙටත් සභාපතිතුමාට උදව් කරනවා නමුත් සභාපතිතුමා එම ස්තානයට පැමිණීම වටින බව එතුමා සඳහන් කළේය. ආණ්ඩුකාරතුමා විසින් භංවතුර ආධාර සඳහා ලබා දීමට සකස් කර තිබූ භාණ්ඩ මලු එම පිරිසට ලබා දුන් බවද එතුමා සඳහන් කළේය.

ප්‍රාදේශිය ලේකම්තුමියට කතා කළත් , මේ දිනවල පවතින තෙල් අර්බුදය හේතුවෙන් ඒමට නොහැකි තත්වයක් හා භාණ්ඩ ලබා දීමේ හැකියාවක් නොමැති බව දැනුම් දුන්නා. මේ වන විට ගමේ සියළුම දෙනාට එකතු වී හැකි අයුරින් ඔවුන්ට තුන්වේල කන්නට දීගෙන යන බව එතුමා සඳහන් කළේය. නමුත් පසුගිය සතිවල ඉන්දියාවෙන් ලැබුණු ආධාර බෙදා දීම සිදු කෙරුනා, ඒ සඳහා තමිල්නාඩු මහ ඇමතිතුමා ඇතුළු ඉන්දීය රජයට ස්තූතිය එල කරන බවත්, මේ ඉන්දියාවෙන් දෙන ලද ආධාර ද්‍රවිඩ ජනතාවට පමණක් නොව ජාති භේදයකින් තොරව බෙදා දීමට කටයුතු කිරීම සුදුසු බව එතුමා පැවසුවේය.

## iii. ගරු මන්ත්‍රී මෝහන සුන්දරම් මහතා

පසුගිය 21 වෙනිදා සිදුවූ නාය යෑම සම්බන්ධව අද වනතුරු රජයේ නිලධාරීන් කවුරුත් පැමිණ නැති බව එතුමා පැවසුවේය. පහළ වේවැල් කැටිය සිටි පරිස 2010 සිට අධි අවධානම් කලාපයට ඇතුලත් වූ බවත් , 2015දී දිගම්බරන් ඇමතිතුමාට කතාකරලා ගෙවල් සාදා දීමට සිටි බවත් , වත්තෙන් ඉඩම් ලබාදීම ප්‍රමාද වූ බවත්, නමුත් ගෙවල් 15ක් හපුගස්තැන්න වත්තෙන් සාදා දුන් බවත්, ආණ්ඩුව වෙනස් වූ නිසා එම නිවෙස් සාදා දීමට නොහැකි වූ බව එතුමා සඳහන් කළේය. ජීවන් තොණ්ඩමාන් මහතා පසුව එම අමාත්‍යාංශ බාරගත්තත් මෙම නිවාස සකස් කර දීමට කටයුතු නොකළ බව එතුමා සඳහන් කළේය. පර්චස් 7ක් ප්‍රමාණයක නිවෙස් සාදා දෙන්න තිබුණා නමුත් කළේ නැහැ. සී.ඩබ්ලිව්.සී එකේ මාළිගාව ලෙස හපුගස්තැන්න තිබුණේ නමුත් දැන් ජනතාව රවටන්න නොහැකි බවත් , ඡන්දයක් අවස්ථාවකදී ඔවුන්ට පාඩමක් උගන්වනු ඇතැයි එතුමා පැවසුවේය. ජෝන් සෙනෙවිරත්න මහත්තයා දිනවන්න උදව් කළ කෙනෙක් තමයි බාබු කන්නන් මහත්තයා මේ අවස්ථාවෙ ඔහු අසරණ වී තිබෙනවා . නමුත් කිසි කෙනෙක් ඔහු පිළිබඳව සොයා බලලා නැති බව එතුමා පැවසුවේය.

ඉන්දියාවෙන් ලබාදුන් ආධාර ලෙස වතුකරයේ ජනතාව වෙත පමණක් නොව ශ්‍රී ලංකාවේ සියළුම ජනතාව වෙනුවෙන් ලබා දීමට කටයුතු කළයුතු බවත්, නමුත් දෙමළ ජනතාව වෙත පමණක් ලබාදීම මේ වන විට සිදුවන බව එතුමා පැවසුවේය.

වතු ජනතාව මේ වන විට ආහාර ද්‍රව්‍ය වල මිල වැඩිවීම මත මහත් අපහසුතාවයට පත්ව ඇති බවත්, වතු සමාගම්වලින් වතු ජනතාවට කොටස් කර ඉඩම් ටික බදු දුන්නා කිසිදු ගිවිසුමක් නොමැතිව , ඔවුන්ගේ පවුල්වල සියළුම දෙනා එකතුවෙලා මේ ඉඩම් සුද්ද කළා.නමුත් පසුව වත්තෙන් කිසිම ගිවිසුමක් නැත්ව ආපහු වත්තට ගත්තා මේක පුදුම අසාධාරණයක්, වතු ජනතාවට වගාකරන්නට වගා නොකල ඉඩම් බෙදා දෙන්න කියලා මනෝ ගනේෂන් ඇමතිතුමා කිව්වා නමුත් තවම ඒ පිළිබඳව කිසිම විසඳුමක් නොමැති බව එතුමා පැවසුවේය. මේ පිළිබඳව කවුරුත් කතා නොකරන බවත් ගරු සභාපතිතුමා මැදිහත් වී මේ පිළිබඳව බලන ලෙස එතුමා පැවසුවේය.

## iv. ගරු මන්ත්‍රී කමනි සේනාධීර මහත්මිය

මේ වන විට රට පුරා වගා සංග්‍රාමයක් පවත්වාගෙන යනවා. රාජ්‍ය ආයතනවල සෑම බිම් අඟලක් පාසාම වගා කිරීමට කටයුතු කරගෙන යනවා සමහර ආයතනවල වගා කිරීම අවසන් කරලත් තිබෙන බව එතුමිය පැවසුවේය. මම යෝජනාවක් කරනවා මහජන නියෝජිතයින් හැටියට ආදර්ශයක් ලෙස මෙම සභා භූමියේ හා ගිලීමලේ බෝග වගාවන් සිදුකරන්න ඕනි. මේ වන විට සමෘද්ධි ව්‍යාපාරය හරහා ගම්වල ගෙවතු වගාව සිදු කරන බවත්, ප්‍රාදේශිය සභාව මගින් ගම් මට්ටමින් මෙම ගෙවතු වගා කිරීම සඳහා

අවශ්‍ය බීජ වර්ග ලබා දීම සිදු කිරීම සුදුසු බවද, කෘෂි කර්ම අමාත්‍යාංශය මගින් අවශ්‍ය සහය ලබා ගැනීමට හැකිවනු ඇතැයිද එතුමිය පැවසුවාය. මෙම වැඩ සටහන කඩිනමින් සිදුකළයුතු බව ද එතුමිය පැවසුවාය. මොහන් මන්ත්‍රීතුමා කිව්වා බාබු කන්නන් බලන්න ජෝන් සෙනෙවිරත්න ඇතිතුමා ගියෙ නැහැ කියලා,ගියෙ නෑ තමයි මොකද එතුමාට දැන් යන්න හැකියාවක් නැහැ නමුත් දුරකථනයෙන් ප්‍රාදේශීය ලේකම්තුමියට කතා කර ඔවුන් වෙත අවශ්‍ය සහන ලබාදෙන්න කියලා කිව්වා. මේ අවස්ථාවේදී රටේ පවතින තත්වය සමඟ නිවාස සාදා දීමට හැකියාවක් නොමැති වුවත් ඉදිරියේදී ඒ පිළිබඳව කටයුතු කරනු ඇතැයි එතුමිය සඳහන් කළාය.

### v. ගරු මන්ත්‍රී ඉන්දික ලක්ෂ්මන් විතාරම මහතා

විපක්ෂයේ මන්ත්‍රීවරු කියන ආකාරයට ජනතාව අද වන විට පීඩාවට පත්වී තිබෙනවා ඒක ඇත්ත. වතු කරයේ ජනතාව වෙනුවෙන් තොණ්ඩමන් ඇමතිතුමා නිවාස සකස් කර දී නොමැති බව මෝහන් මන්ත්‍රීවරයා කිවූ ප්‍රකාශය වැරදි බවත්, ද්‍රවිඩ ජනතාවගේ ඡන්දයෙන් මේ සභාවට පත් වී ඇති එකම සිංහල මන්ත්‍රීවරයා තමන් බවත්, තම කොට්ඨාශයෙන් එහාට යන විට තොණ්ඩමන් පුරම් කියලා බෝඩ් ගහලා තියෙනවා ඒ තොණ්ඩමන් ඇමතිතුමා විසින් වතු ජනතාව වෙත කරන ලද නිවාස වැඩ සටහන් බව එතුමා පැවසුවේය.

එදා උතුරු කරයේ යුද්ධය පවතින අවස්ථාවේදී වතු කරයේ දෙමළ ජනතාව එම යුද්ධය කරා යොමු නොකර මානුෂීය ජනතා නායකයින් ලෙස කටයුතු කළේ තොණ්ඩමන් පවුල බව එතුමා සඳහන් කළේය.ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා කියනවා වගේ කරන්න රනිල් වික්‍රමසිංහ විශ්ම කර්ම පුත්‍රයෙක් නොවන බවත් එදා අයිඑම් එෆ් එකේ නිලධාරීන් එන අවස්ථාවේදී පාරවල් අවහිර කරලා ජනතා ද්‍රෝහීන් ලෙස කටයුතු කරන බවත් මෙම ජනතා විමුක්ති පෙරමුණ , පෙරටු ගාමීන් හා එක්ව එන්ජීඕ මුදල් වලින් රට විනාශ කරන බව එතුමා පැවසුවේය.

### vi. ගරු උප සභාපති ජී.ජී.ජානක පුෂ්පකුමාර මහතා

තම්බිරාජා මහතා සඳහන් කළ වේවැල් කැටිය නාය යෑම පිළිබඳව ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් අපිත් විමසලා බැලුවා. මෙම අපදා අවස්ථාවකදී සිදු කළයුතු මූලික ක්‍රියාකාරකම් මේ වන විට සිදුවී ඇති බවත් යම් යම් අඩුපාඩු සිදුවන්නට ඇති , මේ වගේ අවස්ථාවකදී සභාවෙන් යම්කිසි දෙයක් සිදුවිය යුතුව තිබෙනවා. මේ පිළිබඳව සභාපතිතුමා සමඟ සාකච්ඡා කරමින් ප්‍රාදේශීය ලේකම් තුමිය හා සාකච්ඡා කර තීරණයක් ගමු යැයි එතුමා පැවසුවේය.

මේ රටේ සිදුවුනු සෑම දේකටම හොඳ හෝ නරක සෑම දෙයකටම එදා සිටන් සිටි පාලකයින් වගකිව යුතු වෙනවා. එක් පක්ෂයකට අපි නෑ කියලා බැහැර වෙන්න බැරි බවත්, රත්නපුර ප්‍රාදේශීය සභාවේ වුවද සභාපති උනත්, මන්ත්‍රී උනත් , නිලධාරියෙක් උනත් ඕනෑම වරදක් කළොත් එහි අපකීර්තිය එන්නෙ එක් එක් පුද්ගලයාට නොවන බවත්, සමස්ථයක් ලෙස රත්නපුර ප්‍රාදේශීය සභාවට බව එතුමා පවසමින් වැඩි දුරටත් කියා සිටියේ බෙදී වෙන්වී වාද විවාද කරනවාට වඩා මේ අවස්ථාවේදී එක්ව කටයුතු කළහැකි ආකාරය පිළිබඳව අවධානය යොමුකළයුතු බවයි.

කමනි මන්ත්‍රීතුමිය පැවසූ ආකාරයට වගා සංග්‍රාමය කළයුතු වෙනවා. තමන් මොනවා හරි වගාකරගත්තොත් එය ඉතිරියක් බවත්, වෙළෙඳුන් අසීමිත මිළ ගණන් වලට භාණ්ඩ වෙළෙඳාම් කරනවා අතරමැදියන්ට මැදිවන්නට අපට සිදුවෙලා තිබෙනවා. නමුත් අපි වගා කරගත්තොත් අපේ පරිභෝජනය සඳහා යොදා ගතහැකි බවත්, මේ වන විට සමෘද්ධි ව්‍යාපාරය හරහා එක් වසමක පවුල් 280ක ප්‍රමාණයක් මේ වගාවට යොමු කිරීම සඳහා කටයුතු කරගෙන යන බවත් , ඒ සඳහා බීජ ලබාදෙන බවත් එතුමා සඳහන් කළේය. මේ වැඩපිළිවෙළට අවධානය යොමුකළ යුතු බව එතුමා වැඩි දුරටත් පැවසුවේය.

වගානොකළ ඉඩම් විශාල ප්‍රමාණයක් තිබෙනවා තමන් පදිංචිව සිටින ඉඩමවත් කළමණාකරණය කරගෙන නොමැති බවත්, ඉඩම ලබාගන්න තිබෙන උවමනාව වගා කරන්න නොමැති බවත්, ඔප්පුව ලබා ගැනීමට පමණක් වෙහෙස වන බව එතුමා පැවසුවේය. පුරන් කුඹුරු අස්වැද්දීම වැඩසටහනක් ක්‍රියාත්මක කරන බවත් ඒ සඳහා රුපියල් 25000ක් ලබාදෙන බවත්, මේ සඳහා යොමුවිය හැකි බව එතුමා පැවසුවේය. රජයට පමණක් චෝදනා කරමින් නොසිට තම තමන් නැගී සිටීමට උත්සහ කිරීම කළයුතුව ඇති බව සඳහන් කරමින් සභාවට පැමිණි සියළුම දෙනාට ස්තුතිය එල කරමින් සභාවේ කටයුතු අවසන් කරන ලදී.

**ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක**
**සභාපති**
**රත්නපුර ප්‍රාදේශීය සභාව**